# උත්ථාන සමයේ සතරවන සතිය
# බ්‍රහස්පතින්දා

## පළමුවන කියැවීම

අපෝස්තුළුවරුන්ගේ ක්‍රියාපොතෙන් ගත් පාඨයෙකි ක්‍රියා 13:13-25

**"දෙවියන් වහන්සේ දාවිත්ගේ වංශයෙන් ජේසුස් නම් ගැළවුම්කාරයෙකු දෙවා වදාළ සේක."**

පාවුළු සහ පිරිස පාපස්හි සිට නැව් නැගී ගොස් පම්පිලියේ පාර්ගා නුවරට පැමිණියෝය. එවිට ජුවාම් ඔවුන්ගෙන් වෙන්ව ජෙරුසලමට පෙරළා ගියේය. ඔව්හු පාර්ගාවෙන් පිටත්ව ගමන් කොට, පිසිදියේ අන්තියෝකියට අවුත් සබත් දවසේ දී ධර්ම ශාලාවට ඇතුළු වී අසුන් ගත්තෝය. ව්‍යවස්ථාවලියෙන් ද දිවැසාවලියෙන් ද ධර්ම පාඨ කියෙවූ ධර්ම ශාලා නායකයෝ "සහෝදරයෙනි, මේ සෙනඟට ඔබගෙන් යම් කිසි ධර්මානුශාසනාවක් ඇත්නම් පවසන්නැ" යි ඔවුන්ට දැන්වූහ. එවිට පාවුළු නැගිට, අතින් සංඥා කොට "ඉශ්රායෙල් ජනයෙනි, දේව භය ඇත්තෙනි, සවන් දෙන්න. මේ ඉශ්රායෙල් ජනතාවගේ දෙවියන් වහන්සේ අපේ පියවරුන් තෝරාගෙන, මිසර දේශයේ විදේශීව සිටියදී ඔවුන් උසස් කොට බලසම්පන්න බාහු බලයෙන් ඔවුන් එයින් පිටතට ගෙනා සේක. උන්වහන්සේ සතළිස් අවුරුද්දක් පමණ කාලයක් පාළුකරයෙහි ඔවුන්ගේ හැසිරීම ගැන ඉවසිල්ලෙන් සිටි සේක. උන්වහන්සේ කානාන් දේශයේ ජාතීන් හතක් විනාශ කොට, අවුරුදු හාරසිය පණහක පමණ කාලයක් ඒ ජාතීන්ගේ දේශය ඔවුන්ට උරුම කොට දුන් සේක. එයින් පසු දිවැසිවර සාමුවෙල් දක්වා උන්වහන්සේ ඔවුන්ට විනිශ්වයකාරයන් දුන් සේක.

ඉන්පසු ඔව්හු රජෙකු ඉල්ලා සිටියහ. දෙවියන් වහන්සේ බෙන්ජමින්ගේ ගෝත්‍රයේ මනුෂ්‍යයෙකු වූ කීෂ්ගෙ පුත්‍ර වූ සාවුල්, සතළිස් අවුරුද්දකට ඔවුන්ට දුන් සේක. උන්වහන්සේ ඔහු අස් කර දාවිත් ඔවුන්ගේ රජු හැටියට පත් කළ සේක. උන්වහන්සේ ඔහු ගැන සාක්ෂි දෙමින් 'ජෙස්සේගේ පුත්‍ර වූ, මට ප්‍රියමනාප මිනිසෙකු වූ මාගේ මුළු කැමැත්ත ඉටු කරන්නෙකු වූ දාවිත් මම සොයා ගතිමි' යි වදාළ සේක. දෙවියන් වහන්සේ පොරොන්දු දුන් ලෙස ඔහුගේ පරපුරෙන් ඉශ්රායෙල් සෙනඟට

ජේසුස් නම් ගැලවුම්කාරයෙකු දෙවා වදාළ සේක. උන්වහන්සේගේ පැමිණීමට පෙර ජුවාම් ඉශ්රායෙල්හි මුළු සෙනගට මනස්ථාපනයේ බෞතීස්ම ස්නාපනය දේශනා කළේය. තවද ජුවාම් තම මෙහෙය නිම කරන විට, 'මම කවරෙක් කියා ඔබ සිතන්නෙහිද? මම ඔබ සිතන තැනැත්තා නොවෙමි. මට පසුව කෙනෙක් එන සේක. උන්වහන්සේගේ පාවහන් මුදන්නටවත් මම නොවටිමි' යි කීය.

දේව වාක්‍යය එසේය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 89: 1–2, 20–21,24,26

පිළිතුර: සමිඳුනි, ඔබේ තිර පෙම ගැන මම සදහටම ගයන්නෙමි.

ගීය:

සමිඳුනි, ඔබේ තිර පෙම ගැන මම සදහටම ගයන්නෙමි.
ඔබේ විශ්වාසවන්තකම පරපුරෙන් පරපුරට පවසන්නෙමි.
ඔබේ තිර පෙම සදහටම පවතින බව මම ඒකාන්තයෙන්ම පිළිගනිමි.
ඔබේ විශ්වාසවන්තකම අහස මෙන් තිරසාර බව මම දනිමි.

මා සේවක දාවිත් මම සොයා ගත්තෙමි. ශුද්ධ තෛලයෙන් මම ඔහු ආලේප කළෙමි.
මාගේ ශක්තිය නිරතුරු ඔහු සමඟ වන්නේය.
මාගේ බලය ඔහු සවිමත් කරන්නේය.

මාගේ විශ්වාසවන්තකම සහ තිර පෙම ඔහු සමඟ වන්නේය.
මාගේ නාමයෙන් ඔහු ජයග්‍රාහී වන්නේය.
ඔහු මට මොර ගසමින් 'ඔබ මාගේ දෙවිඳාණෝය, මාගේ පියාණෝය, මාගේ ආරක්ෂක පර්වතයාණෝ ය' කියන්නේය.

# සාධුකාරය

ආලේලූයා! ආලේලූයා!
"මළවුන්ගෙන් උත්ථාන වූ කුළුඳුලාත් මිහිපිට රජුන්ගේ අධිපතියාත් වන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගෙන්
ඔබට කරුණාව හා ශාන්තිය වේවා!"
ආලේලූයා!

# සුවිශේෂය

සුවිශේෂක ජුවාම් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

ජුවාම් 13 : 16–20

**"මා එවන කවරෙකු නමුත් පිළිගන්නා මා පිළිගනියි."**

'ඒකාන්තයෙන්ම මම ඔබට කියමි. දාසයෙක් තම ස්වාමියාට වඩා උසස් නොවේ. එමෙන්ම යවන ලද්දෙක් ඔහු යවන්නාට වඩා උස් නොවේ. ඉදින් ඔබ මේ දේවල් දන්නහු නම්, දැන ඒවා පිළිපදින්නහු නම් ඔබ භාග්‍යවන්තයෝ ය. මා කතා කරන්නේ ඔබ හැම දෙනා ගැනම නොවේ. මා තෝරාගත් අය මම හඳුනමි. 'එහෙත් මාගේ භෝජන වළඳන තැනැත්තා මට විරුද්ධව නැඟී ඇත' යන ශුද්ධ ලියවිල්ල ඉෂ්ඨ වියයුතුය. එය ඉටු වූ විට මම උන්වහන්සේම යයි ඔබ විශ්වාස කරන පිණිස එය ඉටු වන්නට පෙර දැන් පවසමි. ඒකාන්තයෙන්ම මම ඔබට කියමි. මා යවන කවරෙකු නමුත් පිළිගන්නා මා පිළිගනියි. මා පිළිගන්නා මා එවා වදාළ තැනැත් වහන්සේ පිළිගනියි.'

සුවිශේෂ වාක්‍යය එසේය.